**ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ගණන්දීමේ නිලධාරීවෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**-----------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරිම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ පහත සඳහන් ඡේදයේ ඇතුළත් නිරික්ෂණය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවීය.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණවල | ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් සංශෝධනය කර | ස්ථාවර වත්කම්, සිගාස් වත්කම් ලේඛනයට ආරම්භක ශේෂ සටහන් |

| | | |
|---|---|---|
| වටිනාකම රු.2,776,001,859 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.3,130,760,785 ක් වන සේ සංශෝධනය කර තිබුණි. එසේ වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් සංශෝධිතව ඉදිරිපත් කර නොතිබුණි. | ඇතිවිට ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් සංශෝධිතව ඉදිරිපත් කළ යුතුවීම. | කිරීම තවදුරටත් සිදුකරන බැවින් ඊට අදාලව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් සංශෝධනය කිරීමට හැකියාවක් නොමැති වීමෙන් එසේ සිදුකර ඇති බව. |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.10,210,481 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් ලෙස රු.5,499,783 ක් පමණක් දැක්වීම හේතුවෙන් රු.4,710,698ක වෙනසක් නිරීක්ෂණය විය. | මිලදිගැනිම් අදාල කාලපරිච්ඡේදයේදීම ගිණුම් ගත කළ යුතු වීම. | දිස්ත්‍රික්ක 25 ට අදාල වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට නොහැකිවීම හා ඉකුත්වර්ෂයේ ඉන්වෙන්ට්‍රිගත කරන ලද වත්කමට අදාල සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද මුදල ආරම්භක ශේෂයට ගැලපීම් කළ බව. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත පරිදි ජාතික රාජ්‍ය | දෙපාර්තමේන්තුවේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු | මෙම තත්ත්වය ඉදිරියේදී සිදුවීම බලාත්මකවීම සඳහා අංශ ප්‍රධානීන් |

| | | | | |
|---|---|---|---|---|
| | සභාවේ 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | නිලධාරීන් 615 න් 300 ක් එනම් සියයට 49 ක් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වීම. | හරහා අධීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ බව. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.3 ඡේදය | පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා අවශ්‍ය වන ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා කමිටුවක් පත්කර ප්‍රගතිය වාර්තා කරන ලෙස දන්වා ඇති බව. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු.4,574,178ක පොත්, සඟරා හා ලේඛනවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඊට අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික සමීක්ෂණයන් නියමිත කාල පරිච්ඡේදය තුල සිදුකළ යුතු වීම. | 2018 වර්ෂයේ පොත් සමීක්ෂණය 2019 වසර ආරම්භයේදී සිදුකළ බවද එහිදි පොත් 1174ක ඌනතාවන් පිළිබඳ විමර්ශනයක් සමඟ සවිස්තරාත්මක පොත් සමීක්ෂණය 2019 සැප්තැම්බර් මස සිදුකළ බව. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 16.59 ක ප්‍රතිපාදනයට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.මිලියන 8.54ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35.97 ක සිට සියයට 76.42ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා ගන්නා ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු වීම. | චක්‍රලේඛ සීමාවට අනුකූල වීම, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු ලබාදීම ප්‍රමාද වීම, අක්මුදල් නොලැබීම, ප්‍රතිපාදන ලබාදීම වර්ෂය අවසානයේදී සිදුකිරීම යන කරුණු හේතු වූ බව. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය හැරගිය නිලධාරීන් 12කට අදාලව රු.574,167 ක්, මියගිය නිලධාරීන් 04 කට අදාලව රු.344,065 ක්, ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් 02කට අදාළව රු.274,880 ක් හා විශ්‍රාම ගිය නිලධාරීන් 02 කට අදාල රු.232,230ක් වශයෙන් අයවිය යුතු ණය ශේෂයන් පැවතිණි. එම ණය ශේෂයන් තුල වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් තිස්සේ අය කර ගත නොහැකිවූ ණය ශේෂ 10 කට අදාලව රු.317,693ක් පැවතිණි. | ණය ශේෂයන් අයකර ගැනිම සඳහා තවදුරටත් කටයුතු කළ යුතුවීම. | මෙම ණයශේෂ අයකරගැනීමට තවදුරටත් කටයුතු සිදු කරමින් පවතින බව. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2015 ජුලි 14 දිනැති හා අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව යම් නිශ්චිත කාර්යයක් වෙනුවෙන් අත්තිකාරම් ලබාදීමේදි මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 12 කදී එකතුව රු.101,812 ක් වු අත්තිකාරම් මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත ලබා දී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | 2020 සිට මාණ්ඩලික නිලධාරීන් වෙත පමණක් අත්තිකාරම් ලබාදීමට කටයුතු කරන බව. |
| (ආ) නිශ්චිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරියෙකු වෙත ලබා දිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවත් ඊට පටහැනි අවස්ථා 04 කදී දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත එකතුව රු.504,000 ක් වු අත්තිකාරම්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ලබා දී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | 2021 ජන හා නිවාස සංගණනයට අදාල පුහුණු පංති නියමිත දිනවල කළ යුතුවූ හෙයින් මෙම මුදල් අත්තිකාරම් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දුන් බව හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කරන අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යවා ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල වෙත දෙපාර්තමේන්තුවට අදාල නිශ්චිත කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලබාදීමේදී දිස්ත්‍රික් ලේකම්වරු වෙත අදාල මුදල් ලබාදී තිබුණෙන් රු.746,750 ක් දෙපාර්තමේන්තුවෙන් බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් විය යුතු වීම. | විදේශ ප්‍රදානයන් ලෙස ලැබෙන අක් මුදල් ප්‍රතිපාදන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ලබා දිය නොහැකි බැවින් අදාල දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු වෙත අත්තිකාරම් ලෙස ලබා දුන් බවත් මේවන විට අනුමැතිය සඳහා යොමුකර ඇති බවත්. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවත් දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීම් දින දර්ශනය අනුව දත්ත නිකුත් කිරීමට නියමිත දිනයට වඩා මාස 01ක සිට මාස 16ක් දක්වා කාල පරාසයක් ගතවී දත්ත නිකුත් කර තිබූ අවස්ථා 32 ක් නිරීක්ෂණය විය. | නියමිත දිනයන්ට දත්ත නිකුත් කිරීම තුලින් දත්ත පරිශීලකයන් දත්තවල කාලීන බව ගුණාත්මක බව හා ප්‍රයෝජනවත් බව වැඩි කර ගත හැකි බැවින් ඒ සඳහා කටයුතු කළ යුතු වීම. | තාක්ෂණික නව්‍යකරණය, ඇතැම් අංශවල රාජකාරී බහුලත්වය, දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බාහිර හේතු, වරින්වර අමාත්‍යාංශවල විෂය පථය වෙනස්වීම් හා කාර්යමණ්ඩල පුරප්පාඩු යනාදිය මෙයට බලපා ඇති බව. |

### 3.2 කාර්යභාරයන් ඉටුනොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2.354ක්වූ ක්‍රියාකාරකම් 10 ක් වර්ෂය තුල සිදුකර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. | දත්ත එක්රැස් කිරීමට නොහැකි වීම, ප්‍රතිපාදන නොලැබීම, දිස්ත්‍රික්කවල පරිගණක පහසුකම් නොමැතිවීම, අවශ්‍ය ටැබ්ලට් පරිගණක ලබාගැනීමට නොහැකි වීම හා වර්ෂය තුල සිදුකරන ලද කාර්යයන් කාර්යසාධන වාර්තාවට ඇතුලත් කිරීමට අතපසුවීම් සිදුවීම ආදී කරුණු මේ තත්ත්වයට බලපා ඇති බව. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 28 ක් සම්බන්ධයෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා ගැනීම සියයට 25ක සිට සියයට 88ක් දක්වා වූ පරාසයක පැවතිණි. | අපේක්ෂිත නිමවුම් මට්ටම් ළඟා කර ගැනීමෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගත යුතු වීම. | දිස්ත්‍රික් සංවර්ධන නිලධාරින් ගෙන්වා ගැනීමට අපහසුවීම, ටැබ්ලට් පරිගණක ලබාගැනීමට ප්‍රමාදවීම, රටේ පැවති තත්ත්වය, සම්පත්දායකයින් යොදවා ගැනීමේ ගැටළු, විවිධ සමීක්ෂණ සැලසුම් යෙදීම නිසා කාර්ය මණ්ඩලය රාජකාරි බහුල වීම යනාදීය හේතු වූ බව. |

## 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණු, ක්‍රියාකාරී සැලැස්මේ සමහර ක්‍රියාකාරකම්වලට අදාල ප්‍රකාශන හා වාර්තා දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත් කර තිබීමත්, අදාල ක්‍රියාකාරකම් ඉටුකර තිබුණද කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට අතපසුවීමත් වැනි කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් කාර්යසාධන වාර්තාවේ තොරතුරු ඉදිරිපත් කිරීම වගකීම් සහගත බවින් තොරව හා සැලකිලිමත් බවින් තොරව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. | වාර්තා සැකසීමේදී එහි ඵලදායීත්වය වැඩිවීමට නම් ඒවා සම්පූර්ණ හා නිවැරදි තොරතුරු වලින් සමන්විත විය යුතුවීම. | අතපසුවීම් නිසා සිදුවී ඇති බව. |

**3.5 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව වර්ෂ තුනක් සඳහා ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කොට එය මාස හයකට නොඅඩු කාලයක් තුල යාවත්කාලීන කළ යුතුවේ. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන සැලැස්මක් සකසා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පමණක් සකසා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කරගන්නා ලද බව. |

**3.6 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.11,900,000 ක්වූ ධාවන තත්ත්වයේ නොමැති වාහන 04 ක් පැවති අතර ඉන් එක් වාහනයක් 2014 වර්ෂයේ සිටද වාහන 02 ක් 2017 වර්ෂයේ සිටද, අනෙක් වාහනය 2018 වර්ෂයේ සිටද ධාවනයෙන් ඉවත් කර තිබුණි. | ධාවනයට නුසුදුසු වාහන අපහරණය කළ යුතුවීම. | අපහරණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. |

**3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඇප තැබිය යුතු නිළධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නිලධාරීන් දැනුවත් කර ඇති බවද, දෙමසක් ඇතුළතදී එම කටයුතු අවසන් කරන බව. |

**3.8 අනාර්ථික ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 ජනවාරි මාසයේදී අනතුරකට භාජනය වී තිබූ කැබ් රථයක් අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවන බැවින් ධාවනයෙන් ඉවත් කරන මෙන් දේශීය නියෝජිත ආයතනය දන්වා තිබුණි. එසේ තිබියදී වෙනත් ආයතනයකින් රු.1,514,625 ක් වැයකරමින් 2015 වර්ෂයේදී මෙම වාහනය අලුත්වැඩියා කර ගෙන තිබුණද මෝටර් රථ පරීක්ෂකවරයකු එහි යාන්ත්‍රික තත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව දන්වා තිබුණි. 2016 සැප්තැම්බර් මාසයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන්ද මෙම වාහනයේ ධාවන තත්වය විමසා තිබූ අතර ධාවනයට නුසුදුසු බව දන්වා තිබුණි. වාහන අනතුර සිදුවී වසර 5 ක් ඉක්ම ගොස් ඇතත් වාර්තාවේ දිනය වනවිටත් මෙම වාහනයේ අලාභය අයකර ගෙන නොතිබුණි. | වාහන අනතුර සිදුවී වසර 5 ක් ගතවී ඇති බැවින් අලාභය අයකරගැනිමට කඩිනමින් කටයුතු කළ යුතුවීම. | මු.රෙ.104 (4) යටතේ අලාභයක් පිළිබඳව අවසන් පරීක්ෂණය සිදුකිරීම සඳහා කමිටුවක් පත්කර ඇතත් වරින්වර සිදුවූ අමාත්‍යාංශ වෙනස්වීම නිසා මෙතෙක් එම කමිටුව රැස්වී නොමැති බවද එමකමිටුව සම්බන්ධීකරණය කර අවසන් පරීක්ෂණ වාර්තාව අනුව ඉදිරි කටයුතු කරන බව. |
| (ආ) | 2019 මාර්තු සිට 2019 අප්‍රේල් දක්වා නියමු ව්‍යාපෘතියක් සඳහා කුලී වාහන ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,258,736ක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. මෙම කාල සීමාව තුල දෙපාර්තමේන්තුව සතු වාහන ඇණියේ වෑන් රථ 08 ක් ඌන උපයෝජිතවද ඩබල් කැබ් 03 ක් රියදුරන් නොමැතිවද පැවතුණි. | ආර්ථික පිරිමැසුම් ඇතිවන පරිදි කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව සතු වාහන උපරිමඋපයෝජනයෙන් යුතුව භාවිතා කර අතිරේක අවශ්‍යතා සඳහා පමණක් කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු කළ බව. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් හඳුන්වා දෙනු ලබන දර්ශකාංග අනුව යාවත්කාලීන කිරීම් සිදු කිරීම් සියයට 78කින්ද, නව දර්ශකාංග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම සියයට 60 කින් හා දර්ශකාංග රාමුව යාවත්කාලීන කිරීම සියයට 70 කින් වශයෙන් සමාලෝචිත වර්ෂය තුල අදාල නිමවුම් මට්ටම් ලහාකරගෙන තිබුණි. | අපේක්ෂිත නිමවුම් මට්ටම් ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | වසර පුරාම පවත්වන සමීක්ෂණවල තොරතුරු මත පදනම්ව ලබා ගන්නා දත්ත භාවිතා කර සකස් කර ගනු ලබන නව දර්ශකාංග සම්පූර්ණ සමීක්ෂණ කටයුතු අවසන් කර අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කරන තුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීම කළ නොහැකි බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 32 ක් එනම් පුරප්පාඩු 602 ක් පැවතිණි. | තනතුරු පුරප්පාඩු පැවතීම ආයතනයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම තනතුරු පිරවීමටද, එවැනි බලපෑමක් නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමටද අවධානය යොමු කළ යුතු වීම. | පුරප්පාඩු පිරවීමට අදාල කටයුතු කරමින් පවතින බව. |
| (ආ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 05 දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා හා රැකියාවක නිරතවීම සඳහා විදේශ ගත වී තිබුණද, ඔවුන් අදාල කාල සීමාව අවසානයේදී නැවත සේවයට වාර්තා කර නොතිබුණි. මෙම හේතුවෙන් ඔවුන්ගෙන් රජයට අයකර ගත යුතු වර්ෂ 03ක සිට වර්ෂ 13ක් දක්වා කාල පරාසයකට අදාළව රු.1,338,464 ක් අයකර ගත | රජයට අයවිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම සඳහා නීතිපති වෙත යොමු කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | නොහැකිවී තිබුණි. තවද, ඉහත සඳහන් එක් නිලධාරියෙකු විසින් මාස 18ක් සඳහා ලබාගත් අධ්‍යයන නිවාඩු වෙනුවෙන් ගිවිසුමකට බැඳී නොතිබුණු අතර ඒ වෙනුවෙන් අයකර ගත යුතු දන්ඩන මුදලද ගණනය කර නොතිබුණි. | | |
| (ඇ) | වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත්විය යුතු නිලධාරීන් 220ක් වර්ෂ 05 ක සිට වර්ෂ 35 ක කාල පරාසයක් දක්වා ස්ථානමාරුවීම් නොලබා දීර්ඝ කාලයක් එකම ස්ථානයක රාජකාරී සඳහා අනුයුක්ත කර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත වුවත් වසර 35 ක් වැනි දීර්ඝ කාලයක් එක් සේවා ස්ථානයක රැඳී සිටීම අසාමාන්‍ය තත්ත්වයක් බැවින් ස්ථානමාරු පරිපාටිය අනුව කටයුතු කිරීම සිදුකළ යුතුවීම. | සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන ස්ථාන මාරුකිරීම් සිදුකරන බවද, නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් E-HRM තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර විවෘත අයදුම්පත් කැඳවා ස්ථානමාරු කමිටුවක් හරහා ස්ථානමාරු සිදු කිරීමට නියමිත බව. |
| (ඇ) | I.2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම චක්‍රලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි තොරතුරු ඇතුළත් කරමින් සකස් කළ යුතු වීම. | මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බව. |
| | II.චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දිය යුතු වුවත් නිලධාරීන් 293 කු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ලබා දිය යුතු පුහුණු පැය ගණන සම්පූර්ණ කළ යුතු වීම. | ඉදිරි වර්ෂවලදී සෑම නිලධාරියෙකු සඳහාම පැය 12ක පුහුණුවක් ලබාදීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සලකා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කරන බව. |